Journal of Social Sciences, Volume 01, No. 01 (2014) ISSN 2362-0366

# 06. නුවරකලාවියේ ග්‍රාමනාම
# ( මධ්‍යම හුරුලුගම් පළාතේ කල්පේ කෝරළය ආශ්‍රිතව)

ආචාර්ය වසන්ත කේ. දිසානායක, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. E – Mail: dwasanta@yahoo.Com

**සංක්ෂිප්තය**

හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් **කල්පේ කෝරළය** අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම හුරුලු ගම්පළාතට අයත් වේ. වර්තමානයේ කල්පේ කෝරලයට අයත් ග්‍රාම හෙවත් තුලාන් 38 කි. ග්‍රාමනාම අධ්‍යයනයක් තුළින් කළ එළි වන්නේ සිංහල ග්‍රාමීය ජන ජීවිතයේ යටගියාව පමණක් නොව එම ග්‍රමායන්ගේ පෞරාණික බව, අනන්‍යතාවය, උරුමය ආදියත් සමඟ සැඟවී පවත්නා ඉතිහාසයයි. සිංහල රාජධානී විහිදෙන ප්‍රමාණය පවා එමගින් අනාවරණය කරගත හැකිය. අනෙක් අතට බොහොමයක් ගම්නම් වැව් මූලිකව සිදුව ඇති අතරම "වැව" යන්න බොහෝ ගම්නම් අගට යෙදේ.එය වැව්බැඳි රටේ ග්‍රාම නාමයගෙන් විශේෂ ලක්ෂණයකි. වැවක් මූලික කරගනිමින් ගමක් ඉදිවීම ඊට හේතු වන්නට ඇත.ලඳුකැලෑ පොතන් වගුරුබිම් ගහණ මේ ප්‍රදේශයේ ගම්නම් නිර්මාණයේදී ඒවාට විශේෂ ස්ථානයක් හිමිව පවතී.මධ්‍යම හුරුළු ගම් පළාතේ කල්පේ කොරළේ ඇසුරින් කළ මෙකී අධ්‍යයනයේදී ඇති වූ දුෂ්කරතාවන් වන්නේ ඇතැම් ග්‍රාමයන්ගේ අතීත තොරතුරු දන්නා පිරිස් හිඟවීමත් එම පරම්පරා වියැකිමක් හා නූතන පරපුර ඒ පිළිබඳ උනන්දු නොවීමත්ය.

යොමු වචනඃ නුවරකලාවිය, ග්‍රාම නාම, අනුරාධපුරය

**ස්වභාව ධර්මය මුල් කරගිනිමින් බිහි වු ග්‍රාමනාම.**

වෘක්ෂලතා භුවිෂමතා හා ගංගා, ඇළදොළ, පර්වත, කඳු ආදී වූ ස්වභාවධර්මයාගේ පිහිටීම උපයෝගී කරගනිමින් බිහිවු ග්‍රාමනාම.

### තිඹිරි ඇත්තාවල

මෙම ගමෙහි විශාල වළක් වටා තිඹිරිගස් කිහිපයක් පැවැතිබවත් එහිදි පළමුව "තිඹිරි ඇතිවල" ලෙස හැදින්වූ බවත් පසුව "තිඹිරි ඇත්තාවල" නමින් හඳුන්වන්නට යෙදුණු බවත් ගම්වැසියෝ කියති. ඊට හේතුවන්නට ඇත්තේ සුබෝච්චාරණය පිණිස පද පෙරළීම විය හැක.

### පුලියන්කඩවල

සියඹලා ගසක් අසල වු මහා කඩවලක් මුල් කරගිනිමින් "පුලියන්කඩවල" නාමය මෙම ගමට ලැබි ඇත. අතිතයේදී මෙම ප්‍රදේශයේ ද්‍රවිඩ ජනයා ජිවත්ව ඇති අතර අතීතයේ දියුණුව පැවති ග්‍රාමයක් බවට පුරාවිද්‍යාත්මක සාධක මෙහි දක්නට ලැබේ.මෙම ප්‍රදේශයේ පුරාණ වැව් පද්ධතියක් වූ බවට සාධක ඇත. 1818 කැරැල්ලෙන් පසුව මාතලේ ඌව වෙල්ලස්ස ආදි ප්‍රදේශවලින් පැන ආ පිරිස් දුටුවැව, තඹලගොල්ලෑව වැනි ගම්වල පදිංචි විමෙන් පසුව එම ගම්වල සිට මෙම ප්‍රදේශයට මීපැණී රැස්කිරිමට හා දඩයමට පැමිණි පිරිසක් මෙම වැවදැක එළිපෙහළි කර පදිංචි වි ඇත. රත්නායක මුදියන්සේලාගෙන් යුත් පවුල් 6 ක් පමණ මුලදි පදිංචි වි ඇත. නූතන ඉතිහාසය වසර 250 ක පමණ කාලයක සිට ගොඩනැගෙතත් මෙහි පිහිටා ඇති පුරාණ නටඹුන් සුසාන භුමි ආදියෙන් අනාවරණය

වන්නේ අතීතයේ පැවැති දියුණු තත්ත්වයයි. නොයෙක් හේතු නිසා පුරාණ ගම වල්බිහිව ඇත.

**දැකැතිපොතාන**

දැකැති පොතාන වැව ප්‍රතිසංස්කරණය කිරිමට පෙර එම භූමිය ලඳුකැලයෙන් වැසීගත් තැනිතලා බිමක් ( පොතාන් බිමක් ) ලෙස පැවතී ඇත. එම වැව මැදින් වැටී තිබුණු ඇල ( දිගිලිය) මෙම භූමිය තුළ දැකැත්තක හැඩයෙන් පිහිටා තිබුණ බැවින් මෙම ගමේ මුල්ම පදිංචිකරුවන් විසින් "දැකැති පොතාන" යනුවෙන් ව්‍යවහාරකොට ඇත.

**කරදගස්වැව**

ගමට අයත් වැවෙහි බහුල වශයෙන් "කරඳ' ගස් පිහිටීම නිසා මෙම ගම්මානය " කරගස්වැව" නමින් හැඳින්වේ.

**පහල දිවුල්වැව**

අතීතයේදි මෙම ප්‍රදේශය ඝන වනාන්තරයකින් වැසීතිබු අතර කහිල්ලේ රාල සහ නෙල්ලියගොඩ රාල "මාතා හීන්න'' නම් කඳුවැටි පාමුල දියඋල්පත් කිහිපයක් ගලායනු දැක මෙම ස්ථානය පදිංචිය සඳහා තෝරාගෙන දිය උල්පත් හරස්කර ජලාශයක් ගොඩනගන ඔවුහු එම ස්ථානය "පහළ දියඋල් වැව" ලෙස මුලදී හැඳින්වූහ. පසුව " පහලදිවුල් වැව'' නමින් හඳුන්වා ඇතිබව ජනප්‍රවාදයේ එයි.පහළ දිවුල්වැව ග්‍රාමය පිළිබඳ තවත් මතයක් ද ඇත. මෙම ග්‍රාමයට මුලින්ම පැමිණියේ කහලේ සහ මිල්ලවාන යන සහෝදරයන් බවත් ක්‍රි.ව. 1800 දී පහළ දිවුල්වැව වැව් බැම්ම පාමුල ගම් පිහිට වූ බවත් අනෙකුත් ගම්වලට පහළින් මෙම ගම පිහිටීම හා ගම් වැවේ දිවුල් තිබීම නිසා "පහළ දිවුල්වැව'' නාමය ගමට ලැබුණු බව එම මතයයි.

ක්‍රි. ව. 1956 දී පැමිණ ගංවතුර හේතුවෙන් පැරණිගම අභාවයට ගිය අතර වැව ඉස්මත්තේ 1956 පවුල් 30 න් පිහිටවූ මෙම ගම 2006 වනවිට මෙම ග්‍රාමයෙහි පවුල් 130 ක් ජීවත් වූ ගමක් ලෙස දිවුල්වැව හඳුනාගත හැකිය.

**පුහුදිවුල**

මෙම ග්‍රාමය ඓතිහාසික වටිනාකමකින් සමන්විත වූවක් බවට පුරාණ බෞද්ධ ආරාමයක නටබුන් යැයි සිතිය හැකි ගෘහනිර්මාණ කොටස් දක්නට ලැබීමෙන් තහවුරු වේ. "පුහුදිවුල '' ග්‍රාම නාමය පිළිබඳ ගම්මුන්ගේ මතය වන්නේ මෙම ගමෙහි පුහුවලක් ( ජලයරැදෙන වලක් ) ඇති බවත් ඒ ආශ්‍රිතව විශාල වශයෙන් දිවුල්ගස් වැවී තිබීම නිසාත් "පුහුදිවුල්වල '' ලෙස මුලදි හඳුන්වා පසුව "පුහුදිවුල" වශයෙන් භාවිතයට ගත් බවකි. නමුත් "පුහු දිය උල'' "පුහුදිවුල " වී යැයි ද සිතිය හැකිය. මෙම ග්‍රාමය ඇලපත්වැව ගමේ ඔලගමක් ලෙස පැවතී ඇත.ඔලගම වූ කලී අත්හරින ලද පාළුගම් ය.

**මොරවැව**

ජලය පිරිවළක් අසල හොඳින් වැඩුණු මොරගස් පැවැති බැවින් එම ස්ථානය "මොරවිල" විය. පසුව මොර වැව වූ බව පැවසේ.

**වෙලංගහඋල්පත**

මෙම ගමට පැමිණි මුල් පදිංචි කරුවන් විශාල වෙලන් ගහක් මුලින් පොල්ගහක් පමණ ප්‍රමාණයේ ජල කඳක් දැක එම ගමට " වෙලන්ගහඋල්පත" යන නාමය තබා ඇත.

**ඇටවීරවැව**
මෙම ගම්මානයේ පැරණි වන ලැහැබ සම්පූර්ණයෙන්ම ඇටවීර ගස්වලින් වැසී තිබී ඇති බැවින් එම ගමෙහි වැවද මුල්කර ගනිමින් "ඇටවීරවැව" ලෙස ගම හැඳින්වීමට පටන්ගෙන ඇත.

**වාහල්කඩ**
උතුරේ සිට නැගෙනහිරටත් නැගෙනහිර සිට උතුරටත් ඊශාන දෙසින් ඇති මුලතිව්, පුල්මුඩේ ආදී ප්‍රදේශවල සිට අනුරාධපුරයටත් එහි සිට ඉහත ප්‍රදේශවලටත් ගමන් කිරීමේදී මෙම ගම හරහා මාර්ගය පිහිටා තිබෙන බැවින් "සියලු ප්‍රදේශවලට පිවිසීමේ දොරටුව" යන අරුතින් මෙම ග්‍රාමයට වාහල්කඩ යන නාමය දෙන ලදී.

**ඕලුවැව**
මෙම ගමෙහි මුල් පදිංචි කරුවන් පැමිණි අවස්ථාවේ ජලය පිරි වළක ඕලු පඳුරක් වුයෙන් එතැන වැවක් ඉදිකර "ඕලුවැව " නමින් ගම හඳුන්වන්නට යෙදිණි.

**දෙමටවැව**
දෙමට පඳුරුවලින් ගහන වු ප්‍රදේශයක් ලෙස පැවති මෙම ග්‍රාමය ඊට අයිතිවැවද මුල් කරගනමින් " දෙමට වැව" යන නම ලැබී ඇත.

**ඉදිවැව**
ඉදිගස්වලින් සමන්විත ප්‍රදේශයක් වු මෙහි මුල් නාමය " ඉදිපිටිය" විය පසුව වැව මුල්කරගනිමින් "ඉදිවැව'' විය.

**කඩවත් රත්මලේ**
මෙම ගමෙහි වැව්වානේ රත්මල් යායක් වු නිසාත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය හා අනුරාධපුර දිස්ත්‍රික් මායිමේ ගම පිහිටා ඇති බැවින්ද "කඩවත්'' යන කොටසක්ද එකතු කොට " කඩවත්රත්මල්'' යන නාමය පටබැඳි ඇත.

**කෙතේවැව**
මෙහි මුල් පදිංචි කරුවන් වු පුංචි බණ්ඩා ටිකිරා හා මැණිකා ඉදිකළ නිවස අවට තුත්තිරි පිටියක් වු බැවින් මුලදී "තුත්තිරි පිටිය" යන නම භාවිත කළත් පසුව වැව සාදා එයින් පෝෂිත කෙත්යායද මුල් කරගනිමින් "කෙතේවැව" යන නාමය ගමට යොදන ලදී.

**නාගොල්ලෑව**
ගම්වැවේ වානෙහි විශාල නාගස් වුයෙන් ගමේ ජීවත් වු "මඩවල" නම් රටේ මහත්තයා විසින් ගමට" නාගොල්ලෑව" යන නම භාවිත කර ඇත.

**රැලපනාව**
ගම් වාසින් විසින් වැව් බැම්ම මධ්‍යයේ ගල් අල්ලා රැගපනා සකස්කර ඇත. "රැලපනාව ඇල්ලු වැව" යන අරුතින් "රැලපනාව " ලෙස ගමට නම සැකසී ඇත.

**කටුවරගැලැව**
පුහුලේ වැවේ ගම් වාසින් ගමට යාබද කැලෑ ප්‍රදේශයේ කටුඅල ගාල්බැදි විශාල වනයෙහි කටුඅල ගැලවීමේ පුරුද්දක තියැලි සිට ඇත. පසුව එහි ගම්මානයක් ගොඩනැගීමෙන් " කටුඇල ගැලෑව" කටු වරගලෑව" නමින් භාවිතයට පැමිණ ඇත.

**නොලුගොල්ලෑව**
"නෙලු" යන වැල්වර්ගය යාල්වශයෙන් (විශාල ලෙස) පැවතී තිබූ නිසා "නෙළු යාල් " නෙල්ගොල්ල , නෙළුගොල්ලෑව බවට පත්විය.

**හොරොව්පොතාන**
වැව් බැදි රාජ්‍යයේ කුඩා පඳුරු සහිත තැනිතලා බිම් පොතාන් වශයෙන් හඳුන්වනු ලබයි. පොතාන් බිමක් වූ මෙම ගමෙහි උතුරු දෙසින් වැව් 65 ක් වේ. මේවායින් පිටවන ජලය යාන් ඔයට ගමන් කරන්නේ පොතාන් හරහාය. පොතන් බිමෙන් ගලායන ජලය රැස්කර කෘෂිකර්මාන්ත කටයුතු සඳහා යොදා ගැනීමට සිතු ගැමියන් පොතන් බිම හරහා සොරොව් හතක් ඉදිකර ඇත. සොරොව් හතක් සහිත පොතාන, හොරොව්පතාන විය. පසු "ස" '' හ '' වී හොරොව්පොතාන ලෙසට ග්‍රාමනාමය භාවිතයට පැමිණ තිබේ.

**මාවත වැව**
මෙම ගමට පැමිණි කළ සතර දෙසට ගාමන් කළහැකි මාවත් ගණනාවක් අතිතයේ අඩිපාරවල් ලෙස පැවති බවත් ඊට ගම්වැවද සම්බන්ධ කරමින් "මාවත වැව" ලෙස නම් පටබැදි ඇත. මෙම ප්‍රදේශයද ඓතිහාසික වැදගත්කමකින් යුත් ප්‍රදේශයක් බවට තහවුරු වන පුරා විද්‍යාත්මක සාක්ෂ්‍ය රැසක් දක්නට ලැබේ. රජමාලිගයක නටබුන්වලට සමාන ගොඩනැගිලි අවශේෂ මෙහි දක්නට ලැබෙත්.1950 දි පමණ එකම පවුලේ ඥාති පවුල් 05 කින් මෑත කාලයේ ගම ආරම්භ වුවත් අතිතයේ පවතින්නට ඇත. නොයෙක් උවදුරු හේතුවෙන් මෙම ප්‍රදේශ වල් බිහිවිව ඇත. දැනට පවුල් 65 ක් ජීවත්වන ගමකි.

**දියතිත්තවැව**
අතිතයේ "අදිකාරම් කුලම" නමින් හඳුන්වා ඇති මෙම ග්‍රාමය රජදවස අදිකාරම්වරුන් විසු බවටද මතයක් වේ. වර්ෂාවෙන් අඩුපාඩුවක් නොවන මෙම ප්‍රදේශයෙහි ජලය ඕනෑ තරම් ඇත. දිය තිත්ත වන තුරු ඇති බැවින් "දියතිත්ත වැව"නමින් පස කාලිනව ගම හඳුන්වා ඇත. ගම් කෙළවර පිහිටි පිළං බැදි කන්ද නම් කඳු පාමුල සහ මුදුනෙහි ශිලා ලේඛන සහිත ගල්ලෙන් පිහිටා ඇත. නන්දමිත්‍ර යෝධයා විසින් ඉදිකරන ලද පන්සලක් පිළිබඳ එම ශිලා ලිපිවල සඳහන් වේ. මල් ආසන බුදුපිළිම හා කැසිකිළි වැසිකිළි කොටස්වල නටඹුන් ද එහි දක්නට ලැබේ. එබැවින් මෙම ග්‍රාමය ඓතිහාසික වැදගතකමක් දරන්නක් බව තහවුරු වේ.

සතුරු උවදුරුවලින් ජනශුන්‍ය ව ගිය මෙම පෞරාණික බිම වසර 300 කට පෙර නැවත ජනාවාස වි ඇත. එකම පුවලේ ඥතින් විසින් පවුල් දෙකක් ලෙස පැමිණ මහවැව පාමුල නිවාස හතර ක් ගොඩනගා ජීවත් වුවත් වැසි කාලයේ වැව පිටාර ගැලීම නිසා එයින් ඈතට වන්නට කටුමැටි සහිත පිදුරු සෙවෙලි කළ ගෙවල් සාදා ජීවත් විය. එහි ගෙවල් හතක් විය. මෙම නිවාසවල හිදගැනීමට "පිල" යනුවෙන් උස්ව පිහිටි "හෙල්න්කඩ" බැද තිබි ඇත. ගමනා ගමන කටයුතු සඳහා කරත්ත භාවිත කළ අතර කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය විය. ත්‍රස්ත්‍රවාදීතර්ජන පැවති ගමක් වන මෙහි වැසියෝ ඒ කාලයේද ගම්බිම් අත නොහැර ජීවත් වුහ.

**මරදන්කඩකවල**

වත්මන් මරදන්කඩවල වැවෙහි වෑකණ්ඩිය අසල මාදං ගසක් තිබූ අතර එම ගස අසලින් වෑ කන්ද කැඩී යන ලදි. මාදං ගස ළඟින් වැව කැඩී කඩවලක් ඇති වූ බැවින් " මාදංකඩවල" නම බිහිවන අතර ව්‍යවහාර පහසුව පිණිස "මරදන්කඩවල" යන නාමය භාවිතයට පැමිණ තිබේ.මෙම ගමේ ඉතිහාසය ක්‍රි.ව. 1 දක්වා ඈත කාලයට අයත්වේ. මැදගම කන්ද රහත් ලෙන් ආරණ්‍ය සේනාසනය මෙම ගම තුළ පිහිටා ඇති අතර එය වසභ රජතුමා විසින් කළ බවටත් එම කාලයේ දි රහතන් වහන්සේලා වැඩ වාසය කළ බවටත් එහි ඇති සෙල්ලිපි වල සඳහන් වෙයි. ගල්ලෙන්, සඳකඩ පහන්, ගල් ඇදන් සහ පොකුණුවල නටඹුන් මෙහි තිබේ.

වර්තමානයේ පවතින ගම 1870 දි ඉදිළ අතර 1855 වනවිට පවුල් 20 ක් පමණ වැවපාමුල පරණ වත්තේ පදිංචිව සිට ඇත. 1950 ද එම වෑකන් ද නැවත බිඳී යාමෙන් මෙහි වැසියන් ප්‍රධාන මාර්ගය දෙපස තම නිවෙස් ඉදිකර ගන්නා ලදි.

**නබඩ වැව**

"නබඩ" නමින් හඳුන්වන වෘක්ෂ වර්ගය විශාල වශයෙන් ප්‍රදේශයේ වූ බැවින් ගම්මු විසින් මහත් වෙහෙසි ගොඩනැගූ වැවද එක්කරමින් ගමට" නවඩවැව ලෙස වහරන්නට විය. කටුසර බෝග ආහාරයට ගත් මුල්ගම් වැසියන් ගෙවල් 17 කින් යුත් කුඩා ගමක් විය. ගොන්රැදි කරත්තවලින් හොරොව්පතානට යෑමට දින තුනක් ගතවි ඇත. ඉතා දුෂ්කර ජිවිතයක් ගත කළ වැසියන් ජිවිත් වූ ගමක් ලෙස නබඩ වැව හඳුනාගත හැකිය.

***සතුන් සිව්පාවුන් ආදින් මුල්කර බිහිවූ ග්‍රාමනාම***

**මී හොඳවැව**

කැලෑ ගමක්වූ මෙහි අතීතයේ දී හොඳින් පැණි පිරුණු මී වද බහුල වශයෙන් පැවතීම නිසා එම වැව මී හොද වැව ලෙස හඳුන්වා ඇත. වැව් බැදි රාජ්‍යයේ සැම ගමකටම වැවක් ඇති බැවින් මෙම ගමටද "මී හොද වැව" ලෙස වැවද සම්බන්ධ කර ගනිමින් නම තබා ඇත.

**වලහවිද්ද වැව**

ශ්‍රී වික්‍රම රජතුමා විසින් ගම් අධීක්ෂණ කටයුතුවල නිරතව සිටින විටදි ගමේ වැව අසල වලහෙක් වුයෙන් ඊතලයකින් විද වලහා මරන ලදී. වලහාට විද්ද වැව "වලහවිද්දවැව" නමින් ප්‍රසිද්ධ විය. මුල් යුගයේ මෙම ප්‍රදේශ ජනාකිර්ණ වුවත් පශ්චාත්කාලීනව ජනශුන්‍ය පෙදෙස් විය. මුලදි ගෙවල් 12 කින් යුක්ත වූ අතර 1957 සුලිසුළං නිසා බොහෝ විනාශ සිදුවිය. වර්තමානය වන විට මෙහි පවුල් 80 ක් පමණ වාසය කරති.

**නාම්බාකඩ ගම**

ගමේ මුතුන් මිත්තන් පවසන පරිදි වැවේ කඩවල අසල මී ගවයෙක් නිදා සිටි බවත් එම ගවයා විසින් මෙම වල කඩන්නට ඇතැයි සිතා නාම්බා කැඩූ "වල නාම්බාකඩවල'' විය. මුල් පදිංචි කරුවන් පවුල් 2 දෙකක් වූ අතර 1950 දි පවුල් 6 දක්වා වැඩි වී වර්තමානයේදි පවුල් 190 ක් ජිවත් වෙති.

**අලියාකඩ**

විශාල වනාන්තරවලින් හෙබි මෙම ගම්මානය සොයා මුතුන් මිත්තන් ඇවිද යන කල විශාල අලි රංචුවක් ගිය අඩි පාරේ යමින් සිටියදී අලින් බැස ගිය කඩවලක් හමුවිය. එබැවින් එම ගමට "අලියාකඩ " යන නාමය ආරූඪ කරන ලදී.

***ආගමික හා වෙනත් විශ්වාස මූලික කරගනිමින් ගොඩනැගුණු ග්‍රාම නාම***

**තිරප්පන්කඩවල**

පුරාණ ග්‍රාමයකි. මුල්ම පදිංචි කරුවෝ ආදි වාසිහු වෙති. ස්වභාව ධර්මයාගේ නොයෙක් ව්‍යසන හේතුවෙන් ආදි වාසින් විනශ වී ගොස් එක් ආදිවාසියෙක් පමණක් ඉතුරුවිය. මේ වන විට ගමේ වැවද කැඩී බිඳී ගොස් තිබුණි. මෙම ගම්මානයට ඉහළින් වූ පරදෙහියාකඩ ජීවත් වූ සිංහලයන්ට තම ගම ප්‍රධානය කිරිමට ආදිවාසියා කැමති විය. ඒ සඳහා වැවේ කඩවල පිහිටි තැනදී පස්දේවතාවන් වන ඉලන්දාරිදෙවි, බුදුරැස් දෙවි, කම්බිලි දෙවි, කඩවර දෙවි හා අයියනායක දෙවියන් වෙනුවෙන් තිරපහක් සහිත පූජාවක් වැවේ කඩවල ලගදී පවත්වා ගම පුදා ඇත. තරපහ පිදූගම "තිරප්පන්කඩවල " විය මෙහි පවුල් 152 ක් ජීවත් වන අතර යාන් ඔය ගම් සිමාවෙන් ගලා බසි.

**කිඹුල් පැටියාව**

ජනප්‍රවාදයේ පවතින විශ්වාසය වන්නේ කිඹුල්පැටියාව වැව තුළ පිහිටා ඇති කලුගලෙහි රනින් නිම වූ කිඹුල් පැටියෙක් සිටින බවකි. එබැවින් මෙම ගමට "කිඹුල් පැටියාව " නම ලැබී ඇත.

**පුහුලේවැව**

දඩයමේ ගිය පිරිසකට පුහුල් ගෙඩියක හැඩයෙන් යුත් දිලිසෙන වස්තුවක් දැක එය ගැනීමට සැරසෙද්දී අතුරු සඳහන් වී ඇත. ගමට ආ පිරිස ගම්වැසියන්ද සමග නැවත ගොස් බැලුවත් එය නොවිය. රන් පුහුල තිබු වැව "පුහුලේ වැව'' නමින් ප්‍රසිද්ධ විය.

***විදේශීය ජනකොටස් මුල්කර ගනිමින් සකස් වූ ග්‍රාමනාම***

**පරදෙහියාකඩ වැව**

පරදේසක්කාරයින් පැමිණ පදිංචි වූ කඩවල "පරදේසක්කාර වැව" නමින් මුලින් වූ අතර පසුව "පරදෙහියාකඩ වැව" විය.

**හම්බාරයා ගම**

මෙහි එක් පවුලක් පමණක් ජීවත්වන අතර හම්බාවරුන් හෙවත් "මුස්ලිම් වෙළෙන්දන්" ආ ගම "හම්බාරයාගම" විය.

**පරංගියා වාඩිය**

මෙම ග්‍රාමය අතිතයේදී උපුල් විල නමින් හැදින්විය. පෘතුගිසින්ගේ ආගමනයෙන් පසුව ත්‍රිකුණාමලේ සිට මහනුවර රජු බැහැ දැකිමට පරගින් ගමන් කළ මග මෙය වූ අතර ඔවුන් ගමන් වෙහෙස නිවිමට වාඩිලා සිටි ස්ථානය "පරංගියා වාඩිය" නමින් හඳුන්වන්නට යෙදිණි.

මෙම ගම්මානය අනුරාධපුර රාජ්‍ය කාලයට අයත් වුවකි. ක්‍රි. පු. 43 දි පමණ ආරම්භ වුවායැයි සිතන උපුල් මල්විල ග්‍රාමයේ පිහිටා ඇති උපුල්විල රජමහා විහාරය අනුලා බිසව මරා රජු වූ ඇගේ මුරකරුවූ මකලන් තිස්ස රජු විසින් කළ බව කිනිහිරි කන්ද කරඩුවේ සදහන් බවට ජනප්‍රවාදයේ පවතී.මෙකල වැව, වෙල, විහාරයද ඇති වූ බව ජනප්‍රවාදයේ කියවේ. එකල එක් පවුල් ක් පමණ වූ අතර ඉහළ භාගය හා පහළ භාගය නමින් ගම සකස් වී පවතී. අතිත ගල් සොරෙව්වවට අමතරව තවත් සොරොව් දෙකක් නිමවා වැව ප්‍රතිසංස්කරණය කර වර්තමානයේ අක්කර 700 ක කුඹුරු අක්කර ප්‍රමාණයක් අස්වද්දා ඇත.

***නවීකරණ රජයේ යෝජනා ක්‍රම ආදියෙන් බිහිවූ ග්‍රාමනාම***

**අලුත්ගම**

මී හොද වැවට අයත් කුඩා වැවක් වූ මිල්ලගල නමැති වැව ආශ්‍රිතව ඉදිවූ කුඩා ගම්මානයක් වූ මෙම ගම රජයේ පුනරුත්ථාපන ආධාරමත දැනට වසර 20 කට පමණ පෙර ආරම්භවී ඇති අතර අළුතින් ආරම්භ කළ බැවින් "අලුත්ගම " විය. ආරම්භයේදි පවුල් 12 ක් වූ වත් දැනට පවුල් 7 ක් පදිංචිව සිටි.

**අලුත්වත්ත**

මරදන්කඩවල පරණගම මීමුත්තා විසින් ගොඩ නැගූ මෙම ගම පසුව පරණගම පදිංචි මල්හාමි ගොවි මහතා සංවර්ධනය කෙළේය. දැනට පවුල් 160 ක් පමණ ජීවත්වන අතර වැව, වෙල, ප්‍රජාශාලාව පන්සල ආදියෙන් සමන්විත අංග සම්පූර්ණ ගමක් විය. අලුතින් ඇරඹි බැවින් "අලුත්වත්ත" නමින් හදුන්වන්නට ඇත.

***විශේෂ සිද්ධි මුල් කරගනිමින් නිර්මාණය වූ ග්‍රාම නාම***

**හබගම**

තිරප්පන්කඩවල විසූ ආදි වාසින් හබ ඇටවූ ස්ථානයේ පිහිටි ගම "හබගම" විය. මෙහි පවුල් 63 ක් ජීවත් වෙති.

**ලේවාපනික්තිගම**

ගමේ ජීවත් වූ නිලම් නම් පුද්ගලයා ගමේ පිහිටි කිරි උතුරන මැණ්ඩලය ( කිරි උතුරන ස්ථානය ) ට ගොස් කතා කරන ගල ( වැව් බැම්මේ සිට කතා කරන විට වැවට උඩින් පිහිටි ගලේ වැදි හඩ දෝංකාර දෙයි ) දෙස බැලූ විට එහි වූ පැණි වදයක් ලේනෙක් කමින් සටිනවා දකියි. ඉන්පසු නිලම් විසින් ලේනා පැණි කෑවැව ලෙස ගමට නම තබයි. එය පසු කලෙක "ලේවාපනිකැව,"
"ලේවාපනික්කවැව නමින් ප්‍රසිද්ධ විය.

**කල්පේ**

මෙය අමරමල් විල නමින් පුරාණයේ හදුන්වා ඇත. මෙම ගමේ වැව ජලය වැඩි වී කැඩී ගියෙන් ගම් මු එකතු වී උදළු සහ කුඩා යොදා ගනිමින් වැව් බැම්ම සැකසිම ආරම්භ කරන ලදි. එහිදි එක් පුද්ගලයෙක් මෙම බැරෑරුම් කර්තව්‍ය දෙස බලා සිට "මේ කපේ නම් මේ වැව බදින්නට බැරිව" කිවෙලු. පසු කලෙක එම වචනය නිසා අමරමල්විල නාමය ඉවත් වී "කල්පේ" යන්න ගමට යෙදිණි.

***ඓතිහාසික සිද්ධි මුල් බිහිවූ ග්‍රාමනාම***

**වාගොල්ලාකඩ**

මෙය පුරාණ නින්ද ගමකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පොළොන්නරුවේ ඉන්ද්‍රසාර හිමිගේ කවිකිමේ දක්‍ෂතාවය නිසා පූජාකළ ග්‍රාමයකි. මෙම සන්නස පසු කළෙක අතුරුදහන් වීමෙන් එය රජයට පවරා ගන්නා ලදි. මෙහි පදිංචි කරුවන් මාතලේ, කුරුණෑගල , සබරගමුව, ඇලගමුව, ආදි ප්‍රදේශවලින් පැමිණියෝ වෙත ඔවුන් පවුල් 61 කි. මෙහි සතර මංගල්ල සිදුවිය. මෙම ගමට ඔලග ලෙස අලියාකඩ, මරදන්මඩුව, යන ගම්ද විය. නමුත් ඒවා කෝරාලවරුන් විසින් විකුණූ බව ගම්වැසියන් පවසති.

**වැලිමුව පොතාන.**

නිශ්ශංක මල්ල රජතුමා රජකම් කරන කාලයේ මෙම ගම තුළ විශාල ජලාශයෙක් ලෙස තිබූ බවත්. එම ජලාශය හතර වටින් "කිරලාගල", රස්නක වැව, සුදු කිඹුලාගල , නාවෙහෙර යන ස්ථානවල දේවාල හතරකින් එම ජලාශය වට වී තිබුණ බවත් ගැමියෝ කියති. නමුත් මාඝ ආක්‍රමණයෙන් පසුව එම සියල්ල විනාශ වී ඇති බවත් 1818 පසු මාතලේ කැරල්ල නිසා උන්හිටි තැන් අහිමි වූ ජනයා මෙම ප්‍රශයේ පදිංචි වූ බවත් එම ජනයා යලිත් මෙම පෙදෙස ජනාවාස කොට ගොවිතැනින් ජීවත් වූ බවත් පවසයි. මුලදී මෙම ප්‍රදේශයේ තිබූ විශාල ජලාශය හා සම්බන්ධ වී ඔයක් තිබූ බවත් එම ඔය නා ගස් ඔය නමින් හැඳුන් වූ බවත් ප්‍රකටය. මෙහි පංදිචි වූ මිනිසුන් සඳහා හා වෙනත් අවශ්‍යතා සඳහා. මෙම ඔය දිගේ ඉදිරියට යන විට " නා වෙහෙර" නම්පූජනීය ස්ථානය හමු වූ බවත් මෙම වෙහෙර තුළ රත්තරනින් නිම කරන ලද මුවකු සිටි බැවින් මෙම ග්‍රාමය එතැන්පටන් "රණමුව පතාන" ලෙස හැදින්වූ බවත් පසුකාලයේදී මෙම ස්ථානය සතුරු උවදුරුවලින් ආරක්‍ෂාකර ගැනිමට අවශ්‍ය වූ බැවින් හා රහසක් ලෙස තබා ගැනිමට අවශ්‍ය වූ ගැමියන් එකතු වී "රණ්මුව" පතාන යන නම වෙනුවට වෙලී මුව පතාන ලෙස නම් කර ඇත. තවත් පසු කාලයේ " වෙළි" වන නම රිලා යන නමට සම්බන්ධ කර ඇති බැවින් එම ගමට නොගැළපෙන නමක් ලෙස ගැමියෝ දුටුනිසා වැලිමුව පතාන ලෙස වෙනස් කර ගෙන ඇති බවත් දැනට මෙම ගමේ නම "වැලිමුවපතාන" ලෙසත් ගැමියෝ පවසති.

**වාහල්කඩ**

රජරට ප්‍රදේශයේ උතුරු දෙසින් රජරටට ඇතුළු වන මාර්ගයේ දොරටුව යන අරුතින් "වාහල්කඩ'' යන නම ලැබූ මෙම ජනපදය ක්‍රිං:ව 272 තරම් ඈත ඉතිහාසයකට නෑකම් කියයි. එකල සිරිලක පාලනය කළ මහසෙන් රජු විසින් වාහල්කඩ ජලාශය ඉදිකළබව විශ්වාස කෙරේ. මෙම ජලාශය මුල් කරගනිමින් සාම්ප්‍රදායික කෘෂිකාර්මික දිවිපෙවෙතක් මෙහි ගම්වැසියෝ ගත කරති.

සීගිරියේ සිට ආරම්භව ගලා එන යාන්ඩ වාහල් කඩදී තවලම් හම්ල්ලෑව යන අතු ගංගාව එකතු වී යකිණි කන්ද හරහා ගලාවිත් ඇති අතර මහසෙන් රජු විසින් කඩවල ප්‍රදේශයේදී කඳුවැටි දෙකක් යා කර බැම්මක් ඉදිකර අතුගංගාව හරස්කොට ඊට උතුරින් වූ යකිණි කන්දේ සිටි වත්මන් බිසෝ කෙටුව ලෙසින් හඳුන්වන ස්ථානයේ ඇති කඳු වැටි දෙකක් යා කර වැටිමක් ඉදිකර අතුගංගාව හරස්කොට ඊට උතුරින් වූ යකිණි කන්දේ සිට වත්මන් බිසෝ කොටුව ලෙසින් හඳුන්වන ස්ථානයේ ඇති කඳු හරහා සැතපුම් භාගයක් පමණ දිගින් යුත් වේල්ලක් ඉදිකර වාහල්කඩ ජලාශය නිමවා ඇත. මඩ සොරොව්ව නමින් කඩවල ප්‍රදේශයේ සොරොව්වක්ද ගොඩ සොරොව්ව නමින් බිසෝ කොටුව අසල සොරෙව්වක්ද ඉදිකොට තිබී ඇත.

මෙම ප්‍රදේශය ඇති පැරණි සිංහල බෞද්ධ ග්‍රාම වූ බවට සාධක වෙයි. උතුරු දෙසින් පිහිටා ඇති වෙහෙරගලත් දකුණින් ඇති උක්තිරියාගලත් බටහිරින් ඇති ගල් තලාව තුළ දක්නට ඇති විහාර නටබුන් ඒ බවට සාක්ෂ්‍ය වෙත්.ස්වභාවික සහ සතුරු විපත් හේතුවෙන් මෙම ප්‍රදේශ වරින් වර වල් බිහිවී ජනශූන්‍යත්වයට පත් වුවත් 20 වන සියවසින් පසු නැවත ජනාවාස වී ඇත.

වැව් බැඳි රාජ්‍යයයේ ගම් නම් රටා විමසීමේදී පෙනියන පොදු කරුණක් වන්නේ අතීතයේදී බොහෝ ගම්මාන රාජ්‍ය අනුග්‍රහයලද බෞද්ධ ආරාම සංකීර්ණයන්ගෙන් යුත් සශ්‍රීක පෙදෙස්ව පැවැති බවයි. ඒවා ලද රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක මෙන්ම ජනප්‍රවාදගත සාක්ෂ්‍යද විරල නොවේ. අනුරාධපුර රාජධානිය සමයේදි බෙහෙවින් සශ්‍රිකව පැවැති මෙම ප්‍රදේශ රාජධානි නිරිත දිගට විතැන්වීමත් පරසතුරු උවදුරු හා ස්වභාවික විපත් හේතුවෙන් වල් බිහි වි සියවස් ගණනාවක් ජන ශූන්‍ය ලද ලෙස පැවති ඇත. මිට සියවස් කිහිපයකට උඩදී මෙම කැලෑ පෙදෙස් නැවත ප්‍රතිසංස්කරණ කර ජනාවාස බිහිකර තිබේ.

**සාරාංශය**

වර්තමාන ප්‍රාදේශිය බෙදිම්වලට අනුව **කල්පේ කෝරළය** අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම හුරුලු ගම්පළාතේ හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් වේ. අතිතයේ තුලාන් ලෙස හැඳින් වූ ග්‍රාම වර්තමානයේ ග්‍රාමනිලධාරි කොට්ඨාස ලෙසට හඳුන්වයි. හුරුලු පළාතේ අනෙක් ප්‍රධාන කෝරළ වන්නේ මහපොතාන, කුංජුට්ටු, උඩියන් කුලම, මාටොඹුවා, උලගල්ල ආදි කෝරල වේ. කල්පේ කෝරලයට අයත් ග්‍රාම හෙවත් තුලාන් 38 කි. මෙම ග්‍රාමයන්ගේ නම් නිර්මාණය වීම සම්බන්ධ මුඛපරම්පරාගත සාධක සේම, වංශකථාගත සහ පුරාවිද්‍යාත්මක සාක්ෂි තුළින් ඒවායේ ප්‍රභවය, විකාසනය, මෙන්ම අනන්‍යතාව ද තහවුරු කරගැනිමට හැකිවෙයි. සිංහල රාජධානියේ මූලාරම්භ සිදුවූ ප්‍රදේශයට හිමිකම් කියන මෙකී ප්‍රදේශයන්ගේ ඓතිහාසික වටිනාකම හඳුනා ගනුවස් මෙම අධ්‍යයනයේ පහසුව පිණිස ඒ ඒ ග්‍රාමයන්ගේ ප්‍රභවයට හේතු වූ මූලික සංසිද්ධිය අනුව ඒ ඒ ග්‍රාමයන්ගේ නාම විග්‍රහයට ලක්කරනු ලැබේ.

සංස්කෘත භාෂාවේ ''ග්‍රාම'' පාලියෙහි 'ගාම' (බුද්ධදත්ත, 1998:181) යන්නෙන් බිඳී සිංහලට පැමිණි 'ගම' ඉංග්‍රීසි භාෂාවේදී village යන්නට සමානාර්ථවත්ව යෙදේ. (Oxford Advancd Learner's Dictionary, 2010 : 1718) නගරයටත් නියම් ගමටත් කුඩා වූ ජනාවාසය 'ගම' යි, කුඩාම ජනාවාසය, වැඩි අන්‍යෝන්‍ය සම්බන්ධතාවකින් ක්‍රියා කරන අඩු පවුල් සංඛ්‍යාවකින් යුත් ජනාවාසය, නගරයට වඩා පහසුකම්වලින් හා ප්‍රමාණයෙන් ද ජනගහනයෙන් ද අඩු ප්‍රදේශය ගමක් ලෙස හඳුන්වයි. ( සිංහල ශබ්දකෝෂය, 1993 : 3427).

"ගම" යන පදය ශ්‍රී ලංකාවේ ජනාවාස අතර කුඩාම ජනගහන ඒකකය හැඳින්වීම සඳහා පොදුවේ භාවිත කරන පදයක් වශයෙන්ද, පුද්ගලයෙකු සතු ඉඩකඩම් වතුපිටි හෝ වෙනත් දේපළ අයිතිය හැඳින්වීම සඳහා භාවිත කරන පදයක් වශයෙන්ද සැලකිය හැකිය. එමෙන්ම එම වතුපිටි, ඉඩකඩම්, එක් ස්ථානයක රාශිගත වී ඇති පංගු රාශියක් හැඳින්වීම සඳහා ද "ගම" යන පදය භාවිත විය. තවද බෝහෝ විට පුද්ගලයෙකුගේ " ඉඩම්පංගුව" "ගම්කොටුව" , "ගම්පංගුව "ගම්වසම" යන පුද්ගල අයිතිය හැඟවීමට මහනුවර යුගයේ දී ද"ගම'' යන්න භාවිත වූ බව පෙනේ. ගම යන ඒකකය පතත්ව ,

කෝරළය, සහ දිසාව යන විශාල ඒකක දක්වා ගමන් කරන රටේ ප්‍රාදේශිය රාමුව තුළ කුඩාම පරිපාලන න්‍යෂ්ටිය විය. ( හේරත් ,1998 : 199)

මිනිසුන් වසන ස්ථානය "ගම් " ලෙස සුමංගල ශබ්ද කෝෂයේ සඳහන් වෙයි. (සෝරත, 1956 :298). ඇතැම් නිර්වචනවලදී රටක් තුළ පිහිටා ඇති ඉතාමත් කුඩා නගර සහිත ප්‍රදේශ "ගම්" නාමයෙන් හැඳින්විය .(Oxford Advanced Learners Dictionary, 2010: 1718). ජනයා අත්හැර යෑමෙන් හෝ වෙනත් හේතූන් නිසා හෝ පදිංචියට නොගත් පාළුගම් දක්නට ලැබුණි. විත්තිපොත්වල "ඔලගම්" යනුවෙන් සඳහන් වූයේ "පාළුගම් " ය. (පීරිස්, 2001:41) ලංකාවේ ආදිම ජනාවාසයන්හි ''ඒකකය'' ඒකාබද්ධ පවුල් ක්‍රමයයි. එවැනි පවුල් කිපයකින් සැදුණු ගෙවල් සමූහයක් එක් වූ විට ගමක් සැදේ. ( එල්ලාවල, 1968:93) ඥාති සම්බන්ධයෙන් බැඳුණු පවුල් කීපයකින් පැරණි ඉන්දියාවේ ග්‍රාමයක් සකස් වී පැවැති අතර එක් ගෘහයක් හෝ දෙකක් පිහිටා තිබෙන තැනක් ගමක් ලෙස හැඳින්විණි. (කංඛාවිතරණී නම් ප්‍රාතිමෝක්ෂ වර්ණනාව,1998:36) මිනිසුන් වසන හෝ නොවසන ගෙවල් එකක් හෝ දෙකක් ඇති ස්ථානයද ග්‍රාමයක් ලෙස හැඳින්වූ අවස්ථා වේ. (Vinaya Pitakam, 1996;46 ) තිහේ සිට දහස දක්වා පවුල්වලින් සමන්විත ප්‍රදේශයක් ගමක් ලෙසට හඳුන්වා තිබේ. (The Jathaka, 1962: 279)

ගමකට වඩා විශාල වූ ඒකකයක් නියම් ගමක් විය. නගරයකට සමීපව පිහිටි වෙළෙඳ උපනගරය ද "නියම්ගම්" නමින් හඳුන්වා ඇත. "ගම" නැමැති ඒකකයේ වර්ධිත අවස්ථාවක් ලෙස නියම්ගම සැලකිය හැකිය. වේවැල්කැටිය ශිලා ලිපියේ සඳහන්වන පරිදි අනුරපුර යුගයේ අවසන් කාලයේදී ගම් දහයක් එකතුකර 'දසගම' නම් පරිපාලන ඒකක පිහිටුවා " දස ගැමු ඇත්තන්" නමින් පරිපාලන නිලධාරීන් පත්කොට ඇත. බදුලු ටැම්ලිපියට අනුව "මෙ ගම්හි අටදෙනා" සහ අතුරුපොලයා ගම ටැම්ලිපියේ "මෙගම පස්දෙනා "වැනි සඳහන් මගින් ගමේ වර්ධිත අවස්ථා පෙන්නුම් කෙරේ. මහනුවර අවධිය වනවිට ගම් කිහිපයක් එක් කොට "පත්තුව" නම් ඒකකද පත්තු කිහිපයක් එක්කොට "කෝරළ "ද කෝරළ එකතුවී "දිසාව" හෝ "රට "නම් පරිපාලන ඒකක නිර්මාණය කරන ලදී. 1815 න් පසුව මෙම තත්ත්වය තවදුරටත් සංශෝධනය වී ගම් කිහිපයක් එක්කොට "තුලාන" නම් කොට්ඨාසද තුලාන් කිහිපයක් එක්කොට "කෝරළ" ද කෝරළ කිහිපයක් එක්කොට පළාත නම් පරිපාලන ඒකකද පිහිටුවා ඇත. නුවරකලාවියේ වත්මන් පරිපාලන ඒකක ද මෙලෙස නිර්මාණය වී ඇත. (කරුණානන්ද, 1990 :17-18).

ලක්දිව ගම් දනව්වල සීමා නිශ්චය කිරීම, පිහිටුවීම, හා භාවිතය පිළිබඳ සම්ප්‍රදායක් පෙරසිටම වූ බව වංශකථාගත තොරතුරු හා ශිලාලේඛන සාධකවලින් ද සනාථ වේ. (අභයවර්ධන, 1978:5). එනම් විජයාගමනයට පෙර ද මාතුළ, සිරිසවත්ථු, දුනුමඩලාව ආදී වූ ගම් හා නගර මෙහි වූ බවට තොරතුරු සඳහන් වීමෙන් (මහාවංශ ගීතය , 1974:7 -32-33) පැහැදිලි වන්නේ **ගම් නම්** ව්‍යවහාරය අතීතයේ සිටම පැවති බවයි. ඒ අනුව පුද්ගල නාම මුල්කර ගනිමින් **ගම් නම්** භාවිතයේ ප්‍රභවය විජයාගමනය තෙක් දිවෙන්නෙකි. (ඇඳගම , 2003 : 9-10). වංශකථාගත තොරතුරු අනුව ප්‍රථම ආර්ය ජනපද ප්‍රදේශ අටක් මුල්කරගනිමින් ව්‍යාප්ත වූ බව සඳහන් කළ හැකිය. කදම්බනදිය අසබඩ අනුරාධ ඇමති විසින් අනුරාධග්‍රාමය පිහිටි වූ අතර, එම ග්‍රාමයට උතුරු දෙසින් ගම්භිරනදී බඩ උපතිස්ස පුරෝහිතයා විසින් උපතිස්ස ග්‍රාමය පිහිටුවන ලදී. උජ්ජයිනි, උරුවෙල හා විජිත ඇමතිවරු පිළිවෙළින් උජ්ජයිනිග්‍රාමය, උරුවේලග්‍රාමය හා විජිත ග්‍රාමය පිහිටුවූහ. (මහාවංශ ගීතය, 1974:7 -43 - 45). රාම, විජිත , දීඝායු සහ රෝහණ යන ඇමතිවරු පිළිවෙළින් රාමග්‍රාම විජිතග්‍රාම දීඝායුග්‍රාම හා රෝහණග්‍රාම පිහිටුවූහ..(මහාවංශ ගීතය , 1974:7 -32-33) ජලය

පහසුවෙන් ලබාගැනීම මුලික අරමුණු කොට පිහිටවූ මෙම මුල් ජනාවාස ගංගා සහ අතු ගංගා ඔස්සේ වියළි කලාපයේ උතුරුප්‍රදේශ දක්වා ව්‍යාප්ත විය. (Wamsaththappakasini , 1935:261) ප්‍රථම ආර්ය ජනාවාස නැගෙනහිරෙන් මහවැලි ගඟ ඔබ්බට ද දකුණෙන් මධ්‍යම කඳුකරය දක්වා ද පැතිරිණි. (එල්ලාවල 1968: 96 ). මහවැලි ගඟට දකුණෙන් වූ ප්‍රදේශය වූ කාජරගාම ක්ෂත්‍රියයන් හා චන්දන ග්‍රාම ක්ෂත්‍රියයන් විසින් ජනාවාස කරන ලදුයේ කුඹුක්කන් ඔය, මැණික් ගඟ කිරිදිඔය හා වලවේ ගඟ උපයෝගි කොට ගනිමිනි. (මහාවංශ ගීතය, 1974 : 19- 54-55 ) කැලණි ගඟ උපයෝගී කරගනිමින් බටහිර ප්‍රදේශයේ ජනාවාස බිහිවිය. (Mendis, 1985:24). ක්‍රි.පු. 5/6 සියවස්වල ආරම්භ වූ ආර්ය සංක්‍රමණ නිරන්තරව සිදුවන්නට ඇති බැවින් මෙහිදී සංක්‍රමණික හා ස්වදේශික ජනගහනය වැඩි වෙත්ම නව ජනාවාස බිහිවීම වේගවත් වන්නට ඇත. (බලගල්ලේ, 1992 : 9) පණ්ඩුකාභය රජු (ක්‍රි.පු. 377 - 307 ) තම දසවැනි රාජ්‍ය වර්ෂයේදී මෙරට අසූහාරදහසක් ගම් සීමා නිර්ණය කොට දැක්වූ බව වංශකථාවල සඳහන් වේ. ( මහාවංශ ගීතය , 1974:10- 103)

ක්‍රි.පු. 3 වන සියවස වනවිට ලංකාව පුරා පැතිර පවතින ලෙන්ලිපිවලින් ආර්යයන්ගේ ජනාවාස ව්‍යාප්තිය සනාත වන බැවින් ඔවුන් ඉතා දියුණු ත්ත්වයක මේවන විට ජිවත්වන්නට ඇතිබවට අනුමාන කළ හැකිය. සමාජයේ විවිධ පන්තිවලට අයත් පරුමක, බත, ගමණී, ගමික, ගපති ආදීහු මෙම ලෙන් ගුහාවල අයිතිකරුවන් බව ඒවායේ සඳහන් ලෙන් කටාරම් ලිපිවලින් අනාවරණය වේ. මොවුන් ග්‍රාමීය පාලනයේ සුවිශේෂ තනතුරු ලෙස අනුමාන කළ හැකිය. (Paranavithana, 1970: ixxii- ixxxix).

මුල්ම ආර්ය ජනාවාස ගංගා දෝණි මුල්කර ගනිමින් බිහි වූ අතර පසුව ජනාවාස ව්‍යාප්ත විමේදී ගංගා දුර්ලභ ප්‍රදේශවල විශාල ජලාශ ඉදිකිරිම ආරම්භ කෙරුණි. අනුරාධ (මහාවංශගීතය, 1974: 10-85-88) සහ පණ්ඩුකාභය (මහාවංශගීතය,1974 : 10, 85-88) පළමු වාරිමාර්ග ගොඩනැගුවෝ වෙති. වියළි කලාපයේ සෑම පැරණි ගමකම පාහේ ගම්වැව් නිර්මාණය විම වැදගත්කොට සැලකිය හැකිය. සුමනවාපි ගාම, පෙළි වාපිකගාම (මහාවංශගීතය, 1974 : 27-18,39) විහාරවාපි ගාම, හුන්දරීවාපි ගාම, කඩහවාපි ගාම, (මහාවංශගීතය 1974: 32, 39- 90) එවැනි වංශකථාවල සඳහන් වැව් ගම් කිහිපයකි.

කුලගොත් පදනමින් ගම් නිර්මාණය වී පැවැති ආකාරය වංශකථා සහ ශිලාලේඛන මුලාශ්‍රයවලින් අනාවරණය කරගත හැකිය. උපතිස්ස විසින් ගම්භීර නදී තෙර පිහිටවූ බමුණුගමත් ( මහාවංශගීතය , 1974, : 10-20). අනුරාධ පුරයට දකුණෙන් වූ පණ්ඩුල බමුණුගමත්, දඹකොළ පටුනේ සිට අනුරපුරට යන මාර්ගයේ වූ තිවක්ක බමුණුගමත් (මහාවංශගිතය, 1974: 19-60) චේතිය පබ්බතය අසලවූ කුණ්ඩල බමුණු ගම හෙවත් ද්වාරමණ්ඩල ග්‍රාමය (මහාංවශ ගීතය, 1974 : 23-23) ද මෙකල පැවැති බ්‍රාහ්මණ වංශිකයන් පදිංචි වී සිටි ගම් ලෙස අනාවරණය කරගත හැකිය. දෙවන පැතිස් රජු දවස වූ කාජරගාම සහ චන්දන ගාම (මහාවංශගීතය, 1974 : 19 -53). නම් ක්ෂත්‍රීය ග්‍රාමද්වයක් පිළිබඳ තොරතුරු ද දක්නට ලැබේ. චණ්ඩාලයන් විසු ග්‍රාමයන්ද වූ බව වංශකථා ගත තොරතුරුවලින් අනාවරණය කරගත හැකිය. අනුරාධපුර මහා සුසාන භූමියට වයඹ දිගින් පිහිටි චණ්ඩාල ග්‍රාමයක්ද ( Mahabodivamsaya, 18941:84) පණ්ඩුකාභය රජු දවස චණ්ඩාලයන් දහසකින් සමන්විත ගමක් ( මහාවංශ ගීතය, 1974: 10-91 , 92) පිළිබඳවද තොරතුරු රසවාහිනියේ සඳහන්වේ. (රසවාහිනිය II ,1899 :7- 117).
කුලය අනුව පමණක් නොව නොයෙක් රැකියා පදනම් කරගනිමින් ඒ ඒ රැකියාවේ නියුතු පවුල් ඒකරාශී වී පිහිටුවාගත් ග්‍රාම වූ බවට සාධක වෙයි. මෙම ක්‍රමවේදය දීර්ඝකාලිනව

පාරම්පරිකව ක්‍රියාත්මක වූ බවද කිව යුතුය. කුම්භකාරග්‍රාම (Wamsathappakasini,1935:483) වඩ්ඪකි ග්‍රාම (Wamsathappakasini,1935:606) මණිකාරගාම, කණ්ණිකාරක ගාම, කසිකම්මකාර ග්‍රාම (සිහල වත්ථුප්පකරණය, 1959:12) ගොපලු ග්‍රාම (රසවාහිනිය II 1899 :22) කෙවට්ටගාම (රසවාහිනිය, 1899: II-107)එවන් ගම් කිහිපයකි. ලංකාවේ "ගමික" යන වචනය භාරතීය ගම්පති යන්නට සාමානාර්ථවත්ව යෙදී ඇති අතරම "ගමික" හෙවත් " ගාමභෝජක" ගැමි පරිපාලනයේ නායකයා විය. ඔහු ගමේ අධිකරණ හා විධායක කටයුතු පිළිබඳ බලතල දරන්නෙකි. (එල්ලාවල,1968 :104-105) 1832 දී මෙම රාජකාරික්‍රමය අහෝසි කිරීමත් සමඟ කුලය අනුව ගම් ප්‍රධානීහු පත් වූහ. ගොවිකුලයේ වැඩි හිටියෙකු ගමරාල ලෙස පත්වන අතර ඔහු සාම්ප්‍රදායික ගම්ප්‍රධානියෙකි. (හේරත්, 1998: 201).

ආර්ය සහ අනාර්ය ජනකොටස් මෙරට හඳුනාගෙන තිබූ ප්‍රදේශ, වාසභූමි, ගංගා ඇළදොළ, කඳු පර්වත ආදී සමස්තය උත්තර භාරතීය ජන සංක්‍රමණික හේතුවෙන් නොයෙක් විපර්යාසයන්ට පත් වුවද පුරාණ ග්‍රාමනාම සියල්ලම අන්තර්ග්‍රහණය වුවයි සිතිය හැකිය. ක්‍රි.ව. දෙවන සියවස තරමේදී ටොලමි විසින් සම්පාදිත ලංකාවේ මුල්ම සිතියමෙහි අන්තර්ගත ස්ථාන නාම හා වංශකථාගත තොරතුරුවල අඩංගු ස්ථාන නාම හා සැසඳෙන බැවින් එහි වටිනාකම සුළුකොට තැකිය යුතු නොවේ. ක්‍රි. ව. 7 වන සියවස පමණ සිට රචනා වූ සිගිරි කුරුටු ගී ලියුවෝ රටේ සිව්දෙසින් පැමිණි ලාංකිකයෝ වූහ. ඔවුහු ගම්, නියම් ගම්, නගර, පුර, මාගම් නියෝජනය කළ විවිධ තරාතිරමේ පුද්ගලයෝ වූහ. ( නන්දසේන, 1963) ලංකාවේ ඒ ඒ යුගයන්හි පැවති ග්‍රාමයන්හි තත් ස්වභාවය පිළිබඳ විවරණය කරන අගනා සාධක ලෙස සිගිරි ගී අගය කළ හැකිය.

අනුරාධපුර යුගය නිමාවන විට රටේ ප්‍රධාන නගර, උපනගර, ගම් නියම්ගම් සියල්ල සකස්ව පැවැති බවට සැක නැත. කෝට්ටේ යුගයෙන් පසුව බොහොමයක් සිදුව ඇත්තේ ග්‍රාම නාමාදියේ කාලීන වෙනස්කම් හෝ නවීකරණ පමණි. රජුගේ දේශය "රජරට " විය. රජරට දොළොස්වන සියවස තරමේ දී "පතිට්ඨ රට්ඨ" හෙවත් "පිහිටි රට" නමින් හැඳින්වීය. (අභයවර්ධන, 1978 : 96).

"රජරට " සියවස් පහළොවක් පමණ ලක්දිව ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වූ අතර පසු කාලීනව සිදුවූ දේශපාලන අවුල් වියවුල් තුළින් පරිහාණියට පත්වුවද එහි වූ ගම්දනව් නොයෙක් විපර්යාසයන්ට මුහුණ දෙමින් වුවද අවිනෂ්ටව පවතී. කලෙක ජන ශූන්‍ය ප්‍රදේශ ලෙස පැවතුණ ද ඒවායේ මුලබීජ තවමත් සොයා ගැනීම අපහසු නොවේ.ශ්‍රී ලකාද්විපයේ කඩයිම් පොතෙහි "පිහිටිරටට" අයත් රටවල් 43 ක් ද ලක්විදියේ දී ප්‍රදේශ 37 ක් ලෙස ද දක්වා තිබේ. ( අභයවර්ධන 1978 : 96 -97).

අද අනුරාධපුර දිස්ත්‍රික්කය නමින් හඳුන්වන ප්‍රදේශය මහනුවර රාජ්‍ය සමයේදී " නුවරකලාවිය දිසාවනිය" නමින් හැඳින්විය. (කරුණානන්ද, 1990:01) උඩරට රාජධානියට අයත් දිසා දොළසින් එක් දිසාවක් ලෙසට නුවරකලාවිය පැවැති බව ඩේවි සඳහන් කරයි. (ඩේවි දුටු උඩරට රාජ්‍ය හා එහි වැසියෝ , 2002:131). නුවරකලාවිය දිසාවනිය පාලනය කරන ලද්දේ රජතුමා විසින් පත්කරන ලද දිසාවේ වරයකු විසිනි. ඔහු වෙනුවෙන් දිසාවනිය පාලනය කළේ "මහවන්නියා" නම් පාලකයා විසිනි. මහවන්නි උන්නැහේ යටතේ වූ "මුදියන්සේ" නම් නිලධාරියා විසින් පත්තු 16 ක් පාලනය කරන ලදි. 1833 වන විට මෙම දේශීය මුලාදෑනි ක්‍රමය සංශෝධයන විය. ඒ අනුව නැගෙනිහිර සහ බටහිර නමින් පත්තු 8 බැගින් වූ පත්තු 16 කට බෙදන ලදී. එහිදී අප අධ්‍යයනයට ලක්කරන

හුරුලු ගම් පළාත නැගෙන හිර කොට්ඨාසයේ හුරුළුගම් පත්තුව නමින් හැඳින්විණි. 1834 දී කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ නුවර කලාවිය පිහිටුවන අතර 1838 දී උඩරට සෙසු ප්‍රදේශවල ක්‍රියාත්මක දේශීය මුලාදෑනි ක්‍රමයට අනුරූපව ප්‍රතිසංවිධානය කරන ලදි. එහිදි නුවරකලාවිය දිස්ත්‍රික්කය නැගෙනහිර, දකුණ හා බටහිර වශයෙන් කොට්ඨාස තුනක්ද හුරුලුගම්පළාත, කලාගම් පළාත, නුවරගම් පළාත වශයෙන් පළාත් තුනක් යටතේ කෝරාළ 16 ක්ද එක් එක් කෝරළයට අයත් ගමතුලාන් ද නම් කර ඇත. (කරුණානන්ද, 1990 :18) එහිදී කල්පේ කෝරළය අයත් වුයේ හුරුලුගම්පළාතට ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අභයවර්ධන,එච්.ඒ.පි.(1978).සංස්. කඩයිම්පොත් විමර්ශන , සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ඇඳගම,පණ්ඩුල.(2009). *''සබරගමුවේ ගම්නම් රටාව''*,සංස්.පණ්ඩුල ඇඳගම, සබරගමුව වංශ කථාව, 1 වෙළුම, සබරගමුව පළාත් සභාව.

එල්ලාවල, එච්.(1968).පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය,සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කංඛාවිතරණිය ප්‍රාතිමොක්ෂ වර්ණනාව .(1998).පරි. කපිල අභය ගුණවර්ධන , රාජකීය ආසියාතික සමිතිය.

කරුණානන්ද,උක්කු බණ්ඩා .(1990).නුවරකලාවිය 1815 - 1900, කැළණියඃ ශීලා ප්‍රින්ටින් වර්ක්ස්.

ඩේවි දුටු උඩරට රාජ්‍ය හා එහි වැසියෝ .(2008).පරි. යසපාල වනසිංහ, කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, විමල් ජී.(1992).සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය,කොළඹඃඑස්.ගොඩගේ සහ සහෝදරයෝ.

පීරිස්, රැල්ෆ්. (2001). සිංහල සමාජ සංවිධානය, බොරලැස්ගමුව : විසිදුනු ප්‍රකාශන.
බුද්ධ දත්ත හිමි, පොල් වත්තේ. (1998). පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රසවාහිනිය II ,(1899). සංස්.සරණතිස්ස හිමි,කොළඹ : ජිනාලංකාරය යන්ත්‍රාලය.

ලියනගමගේ, අමරදාස. ගුණවර්ධන හා රණවීර. (1961) .අනුරාධපුර යුගය,විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය.

සිංහල ශබ්ද කෝෂය. (1983). 7 වන කාණ්ඩය. කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සිගිරි II ,(1963). සංස්. නන්දසේන,මුදියන්සේ ,කොළඹ : ගුණසේන හා සමාගම.